12.2.1. එම තාවකාලික පුනරුත්ථාපන කටයුතු අධ්‍යක්ෂ (පතල් සුරක්ෂිතතා) අනුමැතිය යටතේ ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු අධීක්ෂණය හා ක්ෂේත්‍ර සහකාරගේ පරීක්ෂාව යටතේ සිදුකළ යුතු අතර, ඒ සඳහා දින 2ක උපරිම කාල සීමාවක් ලබා දිය යුතුය.

12.2.2. එම කටයුතු අවසන් වීමෙන් අනතුරුව සතියක කාලසීමාවක් ඇතුලත ඒ සම්බන්ධයෙන් වාර්තාවක් ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු විසින් අධ්‍යක්ෂ (පතල් සුරක්ෂිතතා) වෙත හා අදාල ලිපිගොනුවට යොමු කළ යුතුය.

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සභාපති
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාලය

CamScanner

12.3. බලපත්‍රයක් අත්හිටුවීම / අවලංගු කිරීම සිදු කර ඇති අවස්ථාවක අදාළ කැණීම් භූමිය ආශ්‍රිත පුනරුත්ථාපන කටයුතු මෙහෙයවීම හා පුනරුත්ථාපන බැදුම්කරය නිදහස් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරන ලද කමිටුවක් මඟින් තීරණය කළ යුතුය.

13. රාජ්‍ය ආයතනයක් විසින් කැණීම් බලපත්‍රයක් අයදුම් කරන්නේ නම් එවැනි අවස්ථාවක පුනරුත්ථාපන බැදුම්කර තබා ගැනීම සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

14. භූගත කැණීමක් (underground mining) සඳහා යෝජිත පුනරුත්ථාපන සැලැස්ම හා පුනරුත්ථාපන බැදුම්කරය ප්‍රාදේශීය කැණීම් ඉංජිනේරු / කැණීම් ඉංජිනේරු විසින් අධ්‍යක්ෂ (පතල් සුරක්ෂිතතා) වෙත ඉදිරිපත් කළ යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කළ කමිටුවක් මඟින් මේ සඳහා අනුමැතිය ලබාදීමට කටයුතු කළ යුතුය.
සැලකිය යුතුයි.

මෙහි භූගත කැණීමක් (underground mining) යනුවෙන් අදහස් කරන්නේ භූමියේ මතුපිටට සම්පූර්ණයෙන් නිරාවරණය නොවූ Shaft, Adit, Tunnel හෝ වෙනත් ක්‍රමයක් මඟින් ප්‍රවේශය ලබා කැණීම් කටයුතු සිදුකරනු ලබන ස්ථාන වේ.

15. මෙම වක්‍රලේඛය ගංගා, ඇළ, දොළ, මුහුදු, වැව්, ජලාශ හා කලපු ආශ්‍රිත බණ්ඩ ඉවත් කිරීමට නිකුත් කරනු ලබන බලපත්‍ර සඳහා අදාළ කර නොගත යුතුය.

C.Geol. M.M.J.P. Ajith Prema
DIRECTOR GENERAL (Actg.)
Geological Survey & Mines Bureau
569, Epitamulla Rd, Pitakotte.

වරලත් භූ විද්‍යාඥ එම්.එම්.ජේ.පී.අජිත් ප්‍රේම
අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)
2023.04.29

පිටපත්:

1. සභාපති (කා.දැ.ස)
2. තොරතුරු තාක්ෂණ අංශය (අවශ්‍ය කටයුතු සඳහා)
3. ප්‍රධාන ලිපිගොනුව

DMS/Gama/2023/Rehabilitation

ජේ.එම්.එස්.වන්. ජයසිංහ
සභාපති
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

CamScanner

අමුණුම - 07

DMS/IN/2025/139

දිනය - 2025.12.31

විසින් - අධ්‍යක්ෂ ජනරාල් 31/12/2025

වෙත - 01.අධ්‍යක්ෂ ගිණුම්

02.අධ්‍යක්ෂ නීති

03.අධ්‍යක්ෂ වාණිජ හිමිකම්

04.අධ්‍යක්ෂ පතල් සුරක්ෂිතතා

05.අභ්‍යන්තර විගණක

05.සහකාර අධ්‍යක්ෂ ගිණුම්

පිටපත් - ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂ කැණීම් (කරුණු දැන ගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා)

විෂය -IWM/C/GSMB/2024/02 විගණන වාර්තාවේ සඳහන් කරුණු වලට අදාළ ඝාකව්ජාවේ ගත් තීරණ වලට අනුව සකස් කරන ලද Googl sheet වාර්තාව යාවත්කාලීන කිරීම් සම්බන්ධව.

73 වන විගණන හා කළමණාකරණ රැස්වීම මඟින් කාර්යාංශයේ පුනුරුත්ථාපන ක්‍රමවේදය පිළිබිඹු වන අයුරින්, ගිණුම් අංශය වර්තමානයේ නඩත්තු කරමින් පවතින දත්ත පද්ධතිය සමාලෝචනය කර නැවත විධිමත් අයුරින් සකස් කිරීමට ලබාදී තිබූ උපදේශනයට අනුව 2025.12.15 දින අදාළ අංශය සමඟ පැවති ඝාකව්ජාවේදී ගනු ලැබූ තීරණයට අනුව, මෙ වන විට Google sheet වාර්තාවක් නිර්මාණය කර ඇත.එම Google sheet එකට අදාළ නොරතුරු 2026.01.01 දින සිට ඔබ අංශ මඟින් යාවත් කාලීන කරන ලෙසත් එහි ප්‍රගතිය සෑම මසකම අවසානයේ මවෙත වාර්තා කරන ලෙසත් මෙමඟින් උපදෙස් ලබා දෙනු ලැබේ.එම Google sheet එක dms@gmail.com දරණ විද්‍යුත් තැපැල් යොමුව මඟින් ඔබ අංශයට අදාළ විද්‍යුත් තැපැල වෙත මේ වන විට යොමු කර ඇත.

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සභාපති
භූ විද්‍යා සම්ක්ෂණ හා පතල් කාර්යාංශය

ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) ස්ථාපිත කිරීමේ ප්‍රගතිය

- කාර්යාංශයේ මූල්‍ය හා කැනීම් අංශ ආවරණය වන පරිදි ERP පද්ධතියක් ස්ථාපනය කිරීමේ කාර්යය සඳහා ඩිජිටල් අමාත්‍යාංශයේ සහායද ලබා ගෙන ඊට අදාළව රැස්වීම් වාර කිහිපයක්ද එම අමාත්‍යාංශය සමඟ පවත්වන ලදී.

- මෙහි කොන්ත්‍රාත් නාමය Design, Development, Implementation and Maintenance of Integrated Reengineered Digital Solution for Mining & Finance Divisions of Geological Survey & Mines Bureau ලෙසින් ඉදිරියට සිදු කරගෙන යාමට තීරණය වී ඇත. මීට ඉහත මෙම කාර්යය සඳහා 2023 වර්ෂයේ දී සිදු කළ ලංසු කැඳවීමේදී තාක්ෂණික යෝජනාවලිය සඳහා කිසිදු ලංසුකරුවකු ලබා ගත යුතු අවම ලකුණු සංඛ්‍යාව ලබා ගැනීමට අපොහොසත් වී තිබූ බැවින් මේ වන විට ලකුණු ලබා දීමේ පටිපාටිය පිළියෙල කර අවසන් කර ඇත. තාක්ෂණික පිරිවිතරයන් සකස් කිරීම ආරම්භ කර ඇතත් ඊට අදාළව Standard Operating Procedure (SOP) අවශ්‍ය බව අනාවරණය වීමත් සමඟ මේ වන විට කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ මහපෙන්වීම යටතේ ජාතික ඵලදායීතා කාර්යාලයේ උපදේශකත්වය මත ඉදිරියට සිදු කිරීමට සැලසුම් කර ඇත.

- ඒ අනුව, මේ සඳහා දෙදින වැඩමුළුවක්ද පැවැත්වූ අතර ඒ අනුව අදාළ Standard Operating Procedure (SOP) සකස් කිරීම ආරම්භ කර ඇති අතර, එම කටයුතු අවසන් කර එම SOP යොදාගෙන ලංසු ලේඛනයේ තාක්ෂණික පිරිවිතරයන් සැකසීම සිදු කිරීමට නියමිතය.

- දැනට පිළියෙල කර ඇති ප්‍රසම්පාදන කාල සටහන අනුව ඉහත සියලු කටයුතු ඩිජිටල් අමාත්‍යාංශයේ උපදේශකත්වය හා මහපෙන්වීම යටතේ නිමකර 2026 ජුනි මාසය වන විට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට සැලසුම් කර ඇත.

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සභාපති
භූ විද්‍යා සම්ක්ෂණ හා පතල් කාර්යාංශය

අධ්‍යක්ෂ (මානව සම්පත්) අනිවාර්ය නිවාඩු යැවීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග

- පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ලබාදුන් උපදෙස් පරිදි පරිවාස කාලසීමාවේ පසු වූ යූ.ජේ.පී.සේනාරත්න මහතා සම්බන්ධව විමර්ශනයක් පවත්වා විමර්ෂන වාර්තාව 2025.10.01 දිනැතිව ලබා දී ඇත. එකී වාර්තාව සම්බන්ධව 358 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය ප්‍රකාරව එම මහතාගේ සේවය 2025.10.17 වන දින අවසන් කර ඇත. මේ මහතා සම්බන්ධව කාර්යාංශයේ කාන්තා නිලධාරීන් වාචිකව අපයෝජනය කිරීම සහ පරුෂ වචනයෙන් බැන වදිමින් ලිංගික අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා පොළඹවා ගැනීමට වාචිකව උත්සහ දැරීමට අදාලව සිදුවීම් සම්බනධව ද 2025.10.01 දිනැති මූලික විමර්ශන වාර්තාවේ වරදකරු බව සාක්ෂි මගින් සනාථ වී ඇත.

- කෝප් කමිටු වාර්තාවේ 5(7), 5(8), 5(9) නිර්දේශ කෙරෙහි අවධානය යොමු කරවමි. එමගින් මෙම නිලධාරියා වෙත වැටුප් ලෙස ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කරන මෙන් දන්වා ඇති බව නිරීක්ෂණ වේ. කෙසේ වුවද සේවය අවසන් කිරීමට ප්‍රථමව පරිවාස කාලයේ පසු වූ මේ මහතාට අදාල චෝදනාවලට අනිවාර්‍ය නිවාඩු ගැන්වීමට ගත් තීරණය වැරදි බවත් එම වැටුප් ලෙස ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කරන ලෙස 358 වන කළමනාකරණ මණ්ඩල තීරණවල සඳහන්ව ඇත.

- 2025.12.18 වන දින පැවැති කෝප් කමිටු වාර්තාවේද අංක 19 යටතේ මේ සම්බන්ධව කටයුතු කලයුතු ආකාරය පිළිබඳව සඳහන් කර ඇති අතර එහිද,

  "පරිවාස වාසයේ සිටින නිලධාරියෙක් සම්බන්ධ වන විනය කටයුත්තකදී අනිවාර්ය නිවාඩු යැවීම වෙනුවට ඔහුගේ සේවය අවසන් කල හැකිව තිබුණි. ඒ අනුව කාර්යාංශය ගෙන තිබූ තීරණය ගැටලුකාරී විය."

  යැයි සඳහන් වේ. එසේම ඉහත කෝප් කමිටු වාර්තාවේ ද "නිර්දේශයක්" ලබා දී ඇත.

  "මේ සම්බන්ධව සිදුකර ඇති විමර්ශන විධිමත් ලෙස නැවත සිදුකිරීම සහ ඒ සම්බන්ධව ගන්නා ලද ක්‍රියාමාර්ග ඇතුලත් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම" ලෙස කාර්යාංශය විසින් කටයුතු කළ යුතු බවට දක්වා ඇත.

- ඒ අනුව 2026.02.10 වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත අධ්‍යක්ෂ (මානව සම්පත්) ලෙස කටයුතු කල යූ.ජේ.පී සේනාරත්න මහතා 2023.12.28 දිනැතිව අනිවාර්ය නිවාඩු ගැන්වීමට අදාලව වැටුප් ලෙස ගෙවන ලද මුදල් නැවත අයකර ගැනීමට හැකියාවක් පවතිනවාද යන්න සහ ඒ සම්බන්ධ නෛතික හැකියාවක් පවතින්නේද යන්න සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීම සඳහා ලිපියක් යොමු කරන ලදී.

- මේ මහතා සම්බන්ධව කාර්යාංශයේ කාන්තා නිලධාරීන් වාචිකව අපයෝජනය කිරීම සහ පරුෂ වචනයෙන් බැන වදිමින් මේ මහතා ලිංගික අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා පොළඹවා ගැනීමට වාචිකව උත්සහ දැරීමට අදාලව සිදුවීම් සම්බන්ධව ද මීට ප්‍රථම විමර්ශනයක් පරිසර අමාත්‍යාංශය විසින් 2023.12.22 දින සිදු කර ඇති අතර එකී චෝදනා සම්බන්ධයෙන් ද මේ මහතා වැරදි කරු බව සනාථ වී ඇත. මීට අමතරව ඒ මහතාට විරුද්ධව කාර්යාංශයේ නිලධාරිනියන් විසින් කාන්තා නිලධාරීන් වාචිකව අපයෝජනය කිරීම සහ පරුෂ වචනයෙන් බැන වදිමින් ඒ මහතා ලිංගික අවශ්‍යතා

ජේ.එම්.එස්.එන්. ජයසිංහ

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සභාපති
නූ විද්‍යා සම්ක්ෂණ හා පතල් කාර්යාංශය

සපුරා ගැනීමට පොළඹවා ගැනීමට උත්සහ දැරීම සම්බන්ධව පොලිසිය වෙත යොමු කරන ලද පැමිණිල්ලකට අනුව ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ E24246 දරණ නඩුව ඇතුලුව නඩු කිහිපයක් පවතින බැවින් අපරාධමය චෝදනා ලැබ ඇත.

- මීට අමතරව එම මහතා වෙත පරිවාස කාලසීමාවේ පසුවන අවස්ථාවේ පහත අවවාද ලිපි නිකුත් කර ඇත.

  i. 2022.11.04 දිනැතිව එවකට කාර්යාංශයේ සභාපති වූ වෛද්‍ය සෙනරත් හේවගේ මහතා විසින් පරිසර අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් පාලන වෙත "අධ්‍යක්ෂ මානව සම්පත් විසින් KL 1021 දරණ කාර් රථය අයතා ලෙස කාර්යාංශ පරිශ්‍රයෙන් බැහැරව ගෙන යාම" මැයෙන් යොමු කරන ලද ලිපිය.

  ii. 2023.01.03 දිනැතිව කාර්යාංශයේ එවකට සභාපති ආර්.සංජීපන් මහතා විසින් අවවාද කිරීම යන මැයෙන් ඔහු වෙත යොමු කරන ලද ලිපිය.

  iii. 2023.02.10 දිනැතිව එවකට කාර්යාංශයේ සභාපති වූ ආර්.සංජීපන් මහතා විසින් කාර්යාංශයේ වාහන භාවිතය පිළිබඳව නිකුත් කල 2023.03.01 දිනැති අවවාද ලිපිය සම්බන්ධව යන මැයෙන් ඔහු වෙත යොමු කරන ලද ලිපිය.

  iv. 2023.02.14 දිනැතිව එවකට කාර්යාංශයේ සභාපති වූ ආර්.සංජීපන් මහතා විසින් පරිසර අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් පාලන වෙත අධ්‍යක්ෂ මානව සම්පත් විසින් KL 1021 දරණ කාර් රථය අයතා ලෙස කාර්යාංශයෙන් බැහැරව ගෙන යාම පිළිබඳ වූ පෙත්සම සම්බන්ධවයි යැන මැයෙන් යොමු කරන ලද ලිපිය.

  v. 2024.01.08 දිනැතිව නිදහසට කරුණු විමසීම යන මැයෙන් එවකට කාර්යාංශයේ සභාපති වූ ආචාර්ය සංජය පෙරේරා මහතා විසින් ඔහු වෙත යොමු කරන ලද ලිපිය.

- මේ වනවිට කෝප් කමිටුව විසින් ලබාදුන් උපදෙස් මත මූලික විමර්ශනයක් පවත්වා එකී විමර්ෂනයෙන් මේ මහතා වරදකරු බව සනාථ වී 358 වන කළමණාකරණ මණ්ඩලය මගින් සේවය අවසන් කිරීම සඳහා ලබාදුන් අනුමැතිය ප්‍රකාරව මේ මහතාගේ සේවය අවසන් කර ඇති අතර අනිවාර්ය නිවාඩු ගැන්වූ කාලසීමාවට අදාලව වැටුප් ලෙස ගෙවන ලද මුදල් අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2026.02.10 දිනැතිව ඉදිරි කටයුතු සඳහා උපදෙස් ඉල්ලා ඇත. ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන උපදෙස් මත ඉදිරි නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කිරීමට නියමිතය.

ජේ.ඩබ්.එස්.එන්. ජයසිංහ
සභාපති
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ

2025.10.01

අධ්‍යක්ෂ ජනරාල්

භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය

නො.569,

එපිටමුල්ල පාර,

පිටකෝට්ටේ.

<u>අධ්‍යක්ෂක මානව සම්පත් සම්බන්ධ විමර්ශන වාර්තාව.</u>

උක්ත විෂයගත කරුණට අදාළව මානව සම්පත් අංශයේ හිටපු අධ්‍යක්ෂක යූ.ජේ.පී.සේනාරත්න මහතා එම කාර්යාලයේ සේවය කරන අවධියේ ඔහු විසින් සේවා ස්ථානයේ කළමණාකරන සහකාරිනියන්ට අශෝභන ලෙස ආමන්ත්‍රණය කිරීම සහ වාචිකව සිදු කළ අපයෝජන ක්‍රියා සම්බන්ධයෙන් ඔබතුමියගේ උපදෙස් ප්‍රකාරව විධිමත් විමර්ශනයක් සහායක විමර්ශන නිලධාරි උදය කුමාර මහතා සමග සිදු කරන ලදි. මෙම විමර්ශනයට අදාළව ප්‍රශ්නගත කරුණු යටතේ පහත සඳහන් නිලධාරිනියන්ගෙන් සහ නිලධාරින්ගෙන් ප්‍රකාශ සටහන් කර ගන්නා ලදි.

1. පෙරුම්බුලි ආච්චිගේ සුනීතා (පරිපාලන නිලධාරි) භූ විද්‍යා කාර්යාංශය,එපිටමුල්ල
2. හල්විටිගල ගමගේ සුදර්ශනි (කළමණාකාර සහායිකා) භූ විද්‍යා කාර්යාංශය,එපිටමුල්ල
3. මධුභාෂිණි භාග්‍යා සමරවීර (කළමණාකාර සහායිකා) භූ විද්‍යා කාර්යාංශය,එපිටමුල්ල
4. පලිහේන දෝන දිල්හානි මධුෂිකා (කළමණාකාර සහායිකා) භූ විද්‍යා කාර්යාංශය,එපිටමුල්ල
5. කොළොන්න අප්පුහාමිලාගේ රංජිත් ප්‍රේමලාල් (ප්‍රවාහන අංශය භාර නිලධාරි) භූ විද්‍යා කාර්යාංශය,එපිටමුල්ල
6. ගොඩගම ආරච්චිගේ නිර්දෝශී ප්‍රියදර්ශනී - සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, එපිටමුල්ල
7. ශාලිකා ප්‍රියංගනී මානවඩු (ගිණුම් නිලධාරිනි) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
8. ළිහිනිකඩුවගේ ලයනල් (කළමනාකරණ සහකාර) මානව සම්පත් අංශය
9. රංවඩන මුදියන්සේලාගේ චමින්ද චන්ද්‍රජීව සෙනෙවිරත්න (කළමනාකරණ සහකාර) මානව සම්පත් අංශය
10. ගාල්ලගේ දෝන මල්ෂිකා රසාංජලී (කළමනාකරණ සහකාරිනි) මානව සම්පත් අංශය
11. පී.ඩී.අමල්කා උදයංගනී නිලකරත්න මහත්මිය (හිටපු කළමනාකරණ සහකාර)

අනිවාර්‍ය නිවාඩු යවා සිටින හිටපු මානව සම්පත් අධ්‍යක්ෂක

12. උඩුවර ජනක පාලින්ද සේනාරත්න

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සභාපති
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

01. පෙරුම්බුලි ආච්චිගේ සුනීතා (පරිපාලන නිලධාරි) භූ විද්‍යා කාර්යාංශය,එපිටමුල්ල

1995.07.03 වන දින සිට මෙම කාර්යාංශයට අනියුක්ත වී 2016.04.05 වන දින සිට උසස් වීමක් ලබා පරිපාලන නිලධාරි වශයෙන් මේ දක්වා සේවය කරන බවත් 2020 වසරේ සිට යූ.ජේ.පී.සේනාරත්න මහතා මානව සම්පත් අංශයේ අධ්‍යක්ෂක ලෙස පත් වී සේවය කළ අතර ඔහු යටතේ සේවය ක ළ කාන්තා නිලධාරිනියන් සියලු දෙනා ම පාහේ අධ්‍යක්ෂකවරයාගේ මෙම නොමනා හැසිරීම් පිළිබඳව පරිපාලන නිලධාරිණිය වශයෙන් ඇය වෙත පැමිණිලි කළ බව කියයි. මේ අනුව, අධ්‍යක්ෂක ජනක සේනාරත්න මහතා හමු වී කාන්තා නිලධාරිණියන්ට අනවශ්‍ය ලෙස හැසිරීම් නොකරන ලෙසත් නිලධාරිණියන්ට අධ්‍යක්ෂකවරයාගේ ගෞරවය තබාගෙන කටයුතු කරන මෙන් දැනුම් දුන්න ද මොහුගේ හැසිරීම් රටාව වෙනස් නොවූ බව කියයි. මේ සම්බන්ධයෙන් කිහිප විටකදි ම ආයතනයේ ඉහළ කළමණාකාරිත්වය දැනුවත් කළ නමුත් ඒ වනවිට සිටි නිලධාරින් මේ සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් නොගත් බව සඳහන් කරයි. මේ වනවිට තම අංශයේ කාන්තා නිලධාරිණියන් කිහිප දෙනෙක් එනම්, එච්.ජී.සුදර්ශනි මහත්මිය සහ භාග්‍යා සමරවීර මහත්මිය පී.ඩී.දිල්හානි මධුෂිකා මහත්මිය ඇතුලු නිලධාරිණියන් සහ ඒ.ආර්.ටී.පෞර්රා මහත්මිය පී.ඩී.ඒ.යූ.නිලකරතින මහත්මිය යන නිලධාරිණවියන් කාර්යාංශයේ වෘත්තීය සමිති සභාපති වශයෙන් කටයුතු කරන රංජිත් කොළොන්න මහතා වෙත දැනුම් දී ඔහු වෙත පැමිණිළි කිරීමෙන් අනතුරුව බොරැල්ල පිහිටි ළමා හා කාන්තා කාර්යාංශය වෙත කැටුව ගොස් කාන්තාවන් වශයෙන් ඔවුනට සිදු වූ වාචික අපයෝජන සහ කාන්තා හිංසන සම්බන්ධයෙන් පැමිණිලි කළ බවයි. ඒ අනුව, දැනට ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක E24246 යටතේ නඩු කිහිපයක් පවතින බවත් සඳහා ඉහත කී නිලධාරිණියන් 2025.09.08 වන දින නඩුව කැඳවා 2025.12.08 වන දිනට නඩුව කල් තබා ඇති බව ප්‍රකාශ කරයි. තවද, අධ්‍යක්ෂකව සිටි යූ.ජේ.පී.සේනාරත්න මහතා එම තනතුරට පත්වීම සම්බන්ධයෙන් පූර්ණ සුදුසුකම් නොමැති බවට මතයක් ගොඩනැගී තිබූ නමත් පසුකාලීනව ත්‍රිපුත්ගල කමිටුවක් පත් කොට එමගින් ඉදිරිපත් කරන ලද ගොනු අංක HR/INQ/8 යටතේ 2025.08.26 දාතම වාර්තාව අනුව යූ.ජේ.පී.සේනාරත්න මහතා නියමිත සුදුසුකම් සපුරා ඇති නිලධාරියෙකු බව පැහැදිලිව සඳහන් කරයි.

02. හල්විටිගල ගමගේ සුදර්ශනි (කළමණාකාර සහායිකා) භූ විද්‍යා කාර්යාංශය,එපිටමුල්ල

2024/09/10 වන දින රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා පහාත් පාලන අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරින් වන එස්.කේ.එස්.ක්‍රිෂාන්ත සහ කේ.එච්.ඩී.ජයසිංහ මහතුන් විසින් ප්‍රකාශයක් ලබා ගත් බව ද ප්‍රකාශය ලබා දීමට හේතුව වූයේ යූ.ජේ.පී.සේනාරත්න මහතාට විරුද්ධව ඇති චෝදනා සහ විෂමාචාර ක්‍රියා කලාපයන් සම්බන්ධව බව සඳහන් කරයි. මානව සම්පත් අධ්‍යක්ෂක වශයෙන් එවකට කටයුතු කළ ඉහත කී නිලධාරි මහතා කාර්යාංශයේ තවත් නිලධාරිණියන් කිහිප දෙනෙකුට ඔහු විසින් සිදු කරන ලද බලවත් වාචික අපයෝජන ක්‍රියා සහ ඔහුගේ හැසිරීම් රටාවට නිලධාරිණියන් අවනත නොවූ විට හිරිහැර කිරීම්, බැන තර්ජනය කිරීම් වැනි කටයුතු සිදු කිරීම් වැනි දෑ සිදු කිරීම මත බව දැක්වෙන විස්තරාත්මක ප්‍රකාශයක් ඉහත කී විමර්ශන නිලධාරින්ට ලබා දුන් බව කියයි. සුදර්ශනී මහත්මිය වාචික අපයෝජනයට ලක් වන අවස්තාව වන විට ඇය අවිවාහක තරුණියක් වන අතර මේ වන විට විවාහ වී සිටින බව කියයි. තමන් ඇතුලු පී.ඩී.දිල්හානි මධුෂිකා, ඒ.ආර්.ටී.රශ්මි, පී.ඩී.යූ.ඒ.නිලකරත්න සහ එම්.බී.සමරවීර යන මහත්මින් කාර්යාලය තුළ සේවය කරන අවස්තාවේ දී මානව සම්පත් අධ්‍යක්ෂක ජනක සේනාරත්න

ජේ.එම්
භූ විද්‍යා සම්
කාර්යාංශය

මහතාගෙන් දිගින් දිගට ම සිදු වන දෛනික හිරිහැර සහ අපහසුතා නිසා සේවයට පැමිණීම සිදු කළේ ද ඉතාම අප්‍රසන්නතාවයකින් යුතුව බව කියයි. මෙම ගැටලු සියල්ල තමා ඇතුලු අපහසුතාවයට පත් නිලධාරිණියන් කණ්ඩායම අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් එවකට කටයුතු කළ අජිත් ප්‍රේම් මහතාට පැමිණිලි කළ ද කිසිදු සහනයක් නොලැබුණු බව කියයි. දිනක් මානව සම්පත් අංශයේ කළමණාකරණ සහායිකා සුජානි මිය සමග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යාලයේ සාක්ච්ඡාවකට සහභාගි වූ අවස්තාවේ මානව සම්පත් අධ්‍යක්ෂකවරයා තමාගේ පපු පෙදෙස දෙස පමණක් බලාගෙන සිටි අතර දැඩි අපහසුතාවයකට පත් වූ බව කියයි. ඇතැම් අවස්තාවල ඔහු හමුවීමට යාමේ දී ලිපි ගොනු කවරයකින් පපුව ආවරණය කරගෙන යන අතර ආයතනයේ අනෙක් නිලධාරින් තමාට ''සුදා'' යන අන්වර්ථ නමින් කතා කරන අතර අධ්‍යන්ෂක ජනක සේනාරත්න මහතා ද ''සුදා'' යනුවෙන් අමතන බව කියයි. එලෙස කතා නොකරන ලෙසට කියා සිටිය ද ඔහු එය නවතා නොසිටි බව කියයි. තම පුද්ගලික ජීවිතය පිළිබඳ නිතර විමසන අතර තමාට ප්‍රේමවන්තයෙකු සිටී ද යන්න සහ කාන්තාවන් කල් යන විට ශරීරය වැරහැලි වන බවත් එසේ වීම නිසා පිරිමින් අකමැති වන බවත් කියූ බව පවසයි. මේ ගැටලුව සඳහා විසදුමක් ලබා ගැනීමට නොහැකි වූ නිසා කාර්යාංශයේ වෘත්තීය සමිති සභාපති වශයෙන් කටයුතු කරන රංජිත් කොළොන්න මහතාව සිද්ධියට අදාළ නිලධාරිණියන් පස් දෙනා සමග ගොස් හමු වී මෙම සිදුවීම ලිඛිත පැමිණිල්ලක් වශයෙන් ඉදිරිපත් කළ අවස්තාවේ මෙම අපහසුතාවයට පත් වූ නිලධාරිණියන් පස් දෙනා බොරැල්ල ළමා හා කාන්තා කාර්යාංශය වෙත රැගෙන ගොස් පැමිණිලි කිරීමට යොමු කරවූ බව කියයි. මේ අනුව, එම කාර්යාංශය මගින් විමර්ශනයක් පවත්වා 2025/09/08 වන දින ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක E24246/29 යටතේ නඩුව කැඳවා නැවත විභාගය 2025/12/08 වන දිනට කල් තබා ඇති අතර සමස්ත රාජ්‍ය සේවයේ සේවිකාවන් වෙනුවෙන් මෙම අකටයුතු ලෙස බලපෑම් සිදු කළ ජනක සේනාරත්න යන අයගේ ක්‍රියා කලාපය පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගතහොත් සෙසු නිලධාරීන්ට පූර්වාදර්ශයක් සැපයෙන බව වැඩි දුරටත් කියා සිටියි.

03. මධුභාෂිණි භාග්‍යා සමරවීර (කළමණාකාර සහායිකා) හු විද්‍යා කාර්යාංශය,එපිටමුල්ල

2023/09/15 වන දින රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා පහාත් පාලන අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරින් දෙදෙනෙකු විසින් ප්‍රකාශයක් ලබා ගත් අතර එම ප්‍රකාශය මගින් මානව සම්පත් අංශයේ හිටපු අධ්‍යක්ෂක යූ.ජේ.පී.සේනාරත්න මහතාගෙන් තම් ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරිණියන් කිහිප දෙනෙකුට ඔහුගේ කාමුක අවශ්‍යතා වෙනුවෙන් තමා ඇතුලු ඇතැම් නිලධාරිණියන් නැඹුරු කර ගැනීම සඳහා දිගින් දිගට ම බලපෑම් කළ බව කියයි. රාජකාරි කටයුතු සඳහා ඔහුගේ කාර්යාලයට යන අවස්තාවල දී නිලධාරිණියන්ගේ පපු පෙදෙස දෙස බලමින් කාමුක අදහස් ඇති කතා පවසමින් වාචික අපයෝජනයට ලක් කිරීමේ අසාර්ථක උත්සාහයක නිරත වූ බව කියයි. මොහුගෙන් සිදු වන බරපතල හිරිහැර පිලිබඳ කාර්යාංශයේ ඉහළ බලධාරින්ට දැනුම් දුන්න ද විසදුමක් නොවූ බැවින් කාර්යාංශයේ වෘත්තීය සමිති සභාපති වශයෙන් කටයුතු කරන රංජිත් කොළොන්න මහතා හමු වී කරන ලද ලිඛිත පැමිණිල්ලකට අනුව නීත්‍යානුකූලව මෙය විසඳා ගැනීම සඳහා ක්‍රියා කළ බවත් ඒ අනුව තමා ඇතුලු නිලධාරිණියන් පස් දෙනා කොළඹ බොරැල්ල ළමා හා කාන්තා කාර්යාංශය වෙත යොමු කොට වෙන් වශයෙන් ජනක සේනාරත්න යන අයට විරුද්ධව පැමිණිලි කළ බවත් එම පැමිණිල්ල අනුව මේ වනවිට ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ E24248/29 යටතේ 2025/09/08 වන දින නඩුව කැඳවා 2025/12/08 වන දිනට කල් තැබූ බවත් ප්‍රකාශ කරයි.

ජේ.ඩබ්.එස්.ඒන්. ජයසිංහ
සභාපති
හු විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යා

04. පලිහේන දෝන දිල්හානි මධුෂිකා (කළමණාකාර සහායිකා) භූ විද්‍යා කාර්යාංශය,එපිටමුල්ල

2024/05/30 වන දින යම් සිදුවීමක් සම්බන්ධයෙන් ඇයට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගෙන තිබූ නිසා වැජ තහනමකට ලක්ව රැකියාවට නොගොස් නිවසේ සිටින බව කියයි. භූ විද්‍යා කාර්යාංශයේ මානව සම්පත් අංශයේ හිටපු අධ්‍යක්ෂක ජනක සේනාරත්න මහතා යටතේ සේවය කරන අවස්තාවේ ඔහුගෙන් රාජකාරි කාලය තුළ දී බරපතළ ලෙස සිදු වූ වාචික අපයෝජනයන්ට ලක් වූ බවත් කොතෙකුත් ඉවසීමෙන් සිටිය ද මොහුගෙන් සිදුවන දෛනික හිරිහැරයන්ගේ අඩුවක් නෙවුණු බව ද කියයි. රාජකාරි කටයුතු සඳහා ඔහුගේ කාර්යාලයට යන අවස්තාවල දී නිලධාරිණියන්ගේ මුහුණ දෙස නොබලා පපු පෙදෙස දෙස බලා හිඳින බවත් ඒ නිසාවෙන් රාජකාරිමය වශයෙන් යම් හිතියකට ලක්ව සිටී බවත් කියයි. මේ හේතුවෙන් කුමන රාජකාරි කටයුත්තකට ඔහුගේ කාර්යාලයට ගිය ද ලිපිගොනු කවරයකින් පපුව ආවරණය කරගෙන යෑමට කටයුතු කළ බව කියයි. මොහුගේ මෙම අසංවර ක්‍රියාවන්ට විරුද්ධ වූ විට අසත්‍ය චෝදනා මතුකොට පරුෂ වචනයෙන් බැණ වැදෙන බවත් එක් දිනක් තමා අත්දිග බලවුසයක් සහ කලු පැහැ සායක් හැඳ සිටී අවස්තාවක රාජකාරි කටයුත්තක් සඳහා ඔහුගේ කාර්යාලයට ගිය විට තමා දෙස බලා ''තමුසේ නිකන් බඩුවක් වගේ'' යනුවෙන් පැවසූ බවත් ඒ පිළිබඳ තමාට ඒ මොහොතේ පැහැදිලි අවබෝධයක් නොවූ බවත් පවසයි. පසුව ඒ පිළිබඳ කාර්යාලයේ වෙනත් නිලධාරිණියක් සමග පවසා සිටි අවස්තාවේ දී එහි අර්ථය පිටකොටුවේ ලස්සනට ඇඳලා පිරිමින් සමග ගැවසෙන කාන්තාවන්ට කියන නමක් බව ඇය තමාට කියා සිටී බව කියයි. ඒ අනුව තමා වහාම ගොස් ජනක සේනාරත්න යන අයගෙන් ඒ පිළිබඳ විමසා සිටි අවස්තාවේ දී ඔහු නැවත දෙවතාක් ම එය තමාට කියූ බව පවසයි. එවිට තමා විසින් '' මහත්තයා මේ රටේ නීතියක් තියෙනවනේ. අපි නීතියෙන් බලාගමු.'' යනුවෙන් පැවසූ බව කියයි. තවද, තමා කොතරම් ආවේගශීලි වූවා ද කිවහොත් තුඩා කල සිට තමාට කිසිවෙකුත් ගණිකාවකගේ ස්වරූප ඇති බව කියා නොමැති බව ද කියයි. එදින තමා ඇඳ සිටී ඇඳුමෙහි ඡායා රූපයක් විමර්ශන නිලධාරින් වෙත ඉදිරිපත් කරන බවත් සිදු වූ මෙම හිරිහැර ඉවසාගත නොහැකිව එවකට හිටපු අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ එවකට සභාපතිතුමා හට මේ සම්බන්ධයෙන් දැනුම් දුන්න ද විසඳුමක් නොවූ බැවින් කාර්යාංශයේ වෘත්තිය සමිති සභාපති රංජිත් කොලොන්න මහතාට පැමිණිල්ලක් ලිඛිතව භාර දුන් අවස්තාවේ දී ඒ මහතාගේ මෙහෙයවීමෙන් තමා ඇතුලු පිඩාවට පත් අනෙක් නිලධාරිණියන් කිහිප දෙනාව කොළඹ ළමා හා කාන්තා කාර්යාංශය වෙත යොමු කොට පැමිණිලි කළ බව කියයි. ඒ අනුව එම කාර්යාංශය මගින් විමර්ශනයක් පවත්වා ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක E24247/29 යටතේ 2025.09.08 වන දින නඩුව විභාග කොට නැවත කැඳවීම 2025.12.08 වන දිනට කල් තැබූ බව පවසයි.

05.කොලොන්න අප්පුහාමිලාගේ රංජිත් ප්‍රේමලාල් (ප්‍රවාහන අංශභාර නිලධාරි) භූ විද්‍යා කාර්යාංශය,එපිටමුල්ල

2004 වසරේ සිට මෙම කාර්යාංශයේ සේවය කරන අතර මේ වනවිට ප්‍රවාහන අංශභාර නිලධාරි ලෙසත් කාර්යාංශයේ පොදුජන ප්‍රගතිශීලි සේවක සංගමයේ සභාපති වශයෙන් ද කටයුතු කරන බව කියයි. 2023.08.11 වන දින හිටපු මානව සම්පත් අධ්‍යක්ෂක ඩනක සේනාරත්න මහතාගෙන් කාන්තා නිලධාරිණියන් පස් දෙනෙකුට සිදු වූ හිංසනයන් සම්බන්ධයෙන් පි.ඩී.ඩී.මධුෂිකා, පි.ඩී.ඒ.යූ.නිලකරත්න, ඒ.ආර්.වී.පෙරේරා, එච්.ජී.සුදර්ශනී සහ එම්.බී.සමරවීර යන නිලධාරිණියන් පස් දෙනාගේ අත්සනින් යුතුව තමා වෙත ඉදිරිපත් කරන ලද ලිඛිත ඉල්ලීම් පැමිණිල්ල අනුව මෙම අනීතික සිදුවීමට අදාළව එවකට

පේ.සුම්.විජේ විජේ, අයකිරණ
භූ විද්‍යා සුමිස්සරා සහ පතල් කාර්යාංශය

ඉහළ බලධාරීන්ගෙන් විසඳුමක් නොලද හෙයින් පීඩාවට පත් නිලධාරිණියන් පස් දෙනාව තමාගේ මැදිහත් වීමෙන් කොළඹ ළමා හා කාන්තා කාර්යාංශය වෙත යොමු කොට ජනක සේනාරත්න යන අය විසින් ඉහත කී නිලධාරිණියන්ට සිදු කරන ලද වාචික අපයෝජන ක්‍රියා සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පැමිණිලි කිරීමට කටයුතු කළ බව පවසයි. ඒ අනුව, ගංගොඩවිල මහේසත්‍රාත් අධිකරණයේ ජනක සේනාරත්න යන අයට විරුද්ධව නඩු පහක් ගොනු කර ඇති බව කියයි. නිලධාරිණියන් පස් දෙනා රාජකාරි අවස්තාවල දී අධ්‍යක්ෂකවරයාගේ නිල කාමරයට යන අවස්තාවල දී ඔවුන්ගේ පපු පෙදෙස දෙස ඉතා ඕනෑකමින් බලා සිටින බවත් ඒ නිසාවෙන් ඔවුන් ලිපිගොනු කවරයකින් පපු පෙදෙස ආවරණය කරගෙන යන බවත් කාන්තාවන් සමග ලිංගිකව හැසිරීම් සම්බන්ධ රාජකාරිමය වශයෙන් අනවශ්‍ය තොරතුරු නිලධාරිණියන් ඉදිරියේ පවසා සිටින බව පැමිණිලි ඉදිරිපත් කළ නිලධාරිණියන් තමා වෙත දන්වා සිටි බව වැඩි දුරටත් කියා සිටියි.

06. ගොඩගම ආරච්චිගේ නිර්දෝෂී ප්‍රියදර්ශනී - සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, එපිටමුල්ල.

2021.10.06 දින සිට මෙම කාර්යාලයේ සේවය කරන අතර මානව සම්පත් අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කල ජනක සේනාරත්න මහතා හොඳින් දන්නා අදුනන අතර සේවා කාලය තුලදී ඔහුගේ කාර්යාලීය ජ්‍යෙෂ්ඨ සේවකයන් වශයෙන් රාජකාරී සම්බන්ධතාවයක් තිබුණ බව කියයි. මොහු විසින් රාජකාරී අවස්ථාවලදී සේවිකාවන් හට නොගිඹිනා අයුරින් කතා කිරීම පිළිබඳ සේවක මණ්ඩලය අතර නිරන්තර කතාබහට ලකවූ බවත් එම නිලධාරිනියන් ඔවුන් හිංසාවට පත්වීම පිළිබඳව එවකට සිටි සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාට දැනුම්දී තිබූ අතර එම චෝදනා පිළිබඳව නොසලකා හැර අධ්‍යක්ෂවරයාට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් බව කියයි. එක් අවස්ථාවකදී තමා අධ්‍යක්ෂ මානව සම්පත් අංශයේ ජනක සේනාරත්න මහතා හමුවීමට ගිය විට උසස් නිලධාරියෙකු වශයෙන් තමන් හට රාජකාරියට නුසුදුසු ආකාරයෙන් කතා කළා. රාජ්‍ය නිලධාරිනියක් වශයෙන් එම අවස්ථාවේදී සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) වශයෙන් මහත් අපහසුතාවයට පත් වුන බවද මේ සම්බන්ධයෙන් තමාගේ අංශභාර ප්‍රධානී සුමෙධා රාහුබද්ධ මහත්මියට පැමිණිලි කල අතර ඇය ඊමේල් පණිවඩයක් මගින් එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල් සහ සභාපති ලෙසට දැනුම් දුන් බව කියයි.

මේ අයුරින් නිලධාරීන් බොහෝ දෙනෙකුට වාචික අපයෝජන සිදු වී තිබූ අතර එම නිලධාරිනියන් පස් දෙනෙකු ළමා හා කාන්තා කාර්යංශයට පැමිණිලි ඉදිරිපත් කර නීති මගින් කටයුතු කළ බව කියයි.

07. ශාලිකා ප්‍රියංගනී මානවඩු - ගිණුම් නිලධාරිනි - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

මානව සම්පත් අංශයේ හිටපු අධ්‍යක්ෂක කාර්යාලයේ සේවිකාවන් හට නුසුදුසු ආකාරයෙන් ඇමතීම සහ ඔවුන් අපහසුතාවයට පත්වන ලෙස කතා කරන බව කියයි. මෙම මහතාගේ කාර්යාලයට රාජකාරී කටයුත්තක් සඳහා ගිය විට කාර්යාලයේ සිටි කාර්යාල සහායක වරයෙකු ඉදිරියේදී තම තනතුරට නොගැළපෙන සහ වෘත්තිය කීර්තිනාමයට හානි වන පරිදි නුසුදුසු වචනවලින් කතා කළ බව කියයි. ඇගේ තනතුරට පහළ කාර්යාල සහයක නිලධාරීන් තමාදෙස මේ අවස්ථාවේ බලා සිටි අතර සේනාරත්න මහතාගේ මෙම කතාවිලාසය නිසාවෙන් තමා දැඩි අපහසුතාවයට පත්වන බවත් එම මහතාගේ මේ ආකාර හැසිරීම් නිසාවෙන් බොහෝ නිලධාරිනියන් රාජකාරී කටයුතු සඳහා ඔහුගේ කාර්යාලයට යෑමට පවා අකමැත්තෙන් සිටි බව කියයි. මේ පිළිබඳව තම අංශ ප්‍රධානී සුමෙධා රාහුබද්ධ මහත්මියට දැනුම් දුන්

ජේ.එම්.ඩබ්.එන්. ජයසිංහ
අධිපති
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

බඩද පසු කාලීනව මෙම නිලධාරීන් කිහිපදෙනක් තමා අගතියට පත් වී ජනක සේනාරත්නගෙන් වූ හිරිහැර පිළිබඳව ළමා කාන්තා කාර්යාංශයේ පැමිණිලි කල බව දන්නා බව කියයි.

08. ලිහිනිකඩුවගේ ලයනල් - කළමනාකරණ සහකාර- මානව සම්පත් අංශය

1995 වසරේ සිට මේ දක්වා මෙම කාර්යාලයේ සේවය කරන අතර අවුරුදු කිහිපයක් මානව සම්පත් අංශයේ අනුයුක්තව කළමනාකරණ සහකාරවරයෙකු වශයෙන් සේවය කරන බව කියයි. 2020 වසරේදී පමණ මානව සම්පත් අධ්‍යක්ෂ ජනක සේනාරත්න මහතා තම කාර්යංශය වෙත පත්වූ බවත් මේ වනවිට යම් යම් චෝදනා මත ඔහු අනිවාර්ය නිවාඩු යවා ඇති බවත් ප්‍රකාශ කරයි. එම මහතා අධ්‍යක්ෂ ලෙස සේවය කරන අවධියේ කළමනාකරණ සහකාරවරියන් වන මධුශිකා මහත්මිය, නිලකරත්න මහත්මිය, ඒ.ආර්.ටී.පෙරේරා මහත්මිය, එම් .සුදර්ශනී මහත්මිය, එම්.වී සමරවීර මහත්මිය යන නිලධාරිනියන් සේනාරත්න මහතාගේ කාර්යාලයට ගිය විටදී එම නිලධාරිනියන්ට බැන වදින බව තමාට ඇසුනු බවද එම අයට මෙන් තමාටද බොහෝ අවස්ථාවලදී ඇඟුම්කම් දී සිටීමට නොහැකි තත්වයේ පිලිකුල් සහගත අයුරින් බැන වැදී තිබුණු බව කියයි. දිනක් තමාගේ අකමැත්ත මත බලෙන් ඔහු තම විශයට අදාල නොවන විශයකට කිසිදු අධ්‍යයනයකින් හෝ දැනුමකින් තොරව අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට යාමට බලකල බවත් තමා එම විශය සම්බන්ධයෙන් කිසිදු දැනුමක් නොමැති නිසා යාමට අකමැති බව සාදරණව දැනුම් දුන්නද විශය භාරව යාමට නිලධාරියෙක් සිටි අතර ඔහු යොදවන්නේ නැතුව තමාට මෙම රාජකාරියට යාමට අකමැති බවට කරුනු අවස්ථාවේ ඉතාමත් පිළිකුල් සහගතව සහ අශෝබන ලෙස බැන වැදුනු අතර තමාට ලැජ්ජාවක් ඇතිවුනු බව ද මන්ද පරිපාලන නිලධාරිනියන් ඉදිරි පිට එලෙස ඇමතීම නිසා බව කියයි.

මෙම කාර්යාලයේදී බොහෝ අවස්ථාවල ඉහල සඳහන් කරන ලද නිලධාරිනියන්ට ජනක සේනාරත්න මහතාගේ කාර්යාලයට ගොස් ඔහු හමුවී රාජකාරී කර පැමිණෙන අවස්ථාවලදී ඔවුන් හට ඉවසා ගත නොහැකි තත්වයේ වචන වලින බැණ වැදුනු බව තමාවෙත දැන්වූ අවස්ථා තිබෙන බව කියයි. තම තනතුර අවතක්සේරුවට ලක්කරමින් ඔහුගේ පුද්ගලික ඕනෑ එපාකම් සඳහා බඩු බාහිරාදිය ගෙන ඒමට ආයතනයෙන් බැහැර පිටකෝටියේ ප්‍රදේශයට රාජකාරී වේලාව තුලදී පිටත් කර හරින බව ප්‍රකාශ කරයි.

09. රංවඩන මුදියන්සේලාගේ චමින්ද චන්ද්‍රජීව සෙනෙවිරත්න - කළමනාකරණ සහකාර - මානව සම්පත් අංශය

2013 වසරේ සිට මානව සම්පත් කාර්යාංශයේ කළමනාකරණ සහකාරවයෙකු වශයෙන් සේවය කරන අතර පසුගිය 2020 වසරේදී මානව සම්පත් අධ්‍යක්ෂ වශයෙන් ජනක සේනාරත්න මහතා පත්වූ බවත් ඔහු සේවය කරන කාලයේ කළමනාකරණ සහකාරවරියන් පිරිසකට එම මහතාගේ කාර්යාලයට රාජකාරී සඳහා ගිය විට බැන වදින බව තමාට ඇසුනු බව කියයි. එම අයට පමණක් නොව කාර්යාංශයේ ඇතැම් නිලධාරීන් මෙම නිලධාරියාගේ අශෝභන හැසිරීම් නිසා දෛනිකව අපහසුතාවයට පත්වී තිබුණා. ඉහත කී නිලධාරීන් 05 මොහුගේ ක්‍රියා කලාපය පිළිබඳව කොළඹ ළමා හා කාන්තා කාර්යාංශයේ ඔහුට විරුද්ධව පැමිණිලි කර ඇති බව කියයි.

10. ගාල්ලගේ දෝන මල්ෂිකා රසාංජලී - කළමනාකරණ සහකාරිනි - මානව සම්පත් අංශය

පේ.එම්.එස්.එන්. ප්‍රසාදිනී
සහකාර
කතු විද්‍යා සම්බන්ධතා හා පවාල් කාර්යා

2019 වසරේ සිට මෙම කාර්යාංශයේ මානව සම්පත් අංශයේ මේ වනතෙක් සේවය කරන අතර 2020 වසරේ පමණ සිට මානව සම්පත් අංශයේ අධ්‍යක්ෂ වශයෙන් ජනක සේනාරත්න මහතා පත්වූ බව කියයි. මේ වනවිට ඔහුට විරුද්ධව පවතින් චෝදනා අනුව අනිවාර්ය නිවාඩු යවා තිබෙන බව ප්‍රකාශ කරයි. ඔහු සමග සේවය කළ කළමනාකරණ සහකාරවරියන් හට වාචික අපයෝජනය වන ලෙස කතා කිරීම සහ හැසිරීම නිසා එම අය දැනට නීති මගින් ක්‍රියා කර තිබෙනවා. ඔවුන්ට පමණක් නොව මෙම මහතාගේ කාර්යාලයට තමා ගිය අවස්ථාවලදී ඔහු සමග කතාබහ කරන විට තම මුහුණ දෙස නොබලා ලැම පෙදෙස දෙස ඉතා ඕනෑකමින් බලා සිටීම සිදුකරනවා. මේ නිසා රාජකාරී කිරීම සඳහා ඔහුගේ කාර්යාලයට යන්නේ දැඩි පිළිකුලකින් සහ බියකින් යුතුව බව කියයි. රාජකාරී සඳහා ඔහුගේ කාර්යාලයට ගිය අවස්ථාවලදී හැකි ඉක්මනින් එම ස්ථානයෙන් පිටවන්නේ කෙසේද යන්න සිහිකරමින් නොසන්සුන්ව ගත කරන බව සඳහන් කරයි. ඉහත කී නිලධාරිනියන් පස් දෙනා මොහුට විරුද්ධව නීති මගින් පැමිණිලි කිරීමට ගිය විට තමන් ප්‍රසූත නිවාඩු ගොස් සිටි බවත් එසේ නොමැති නම් තමාද මෙම නිලධාරිනියන් සමග මොහුට විරුද්ධව පැමිණිලි කිරීමට පොලිසි යන බව සඳහන් කරයි. ආයතනයක ප්‍රධානියෙකු වශයෙන් මොහු තමන් වැනි කළමනාකරණ සහකාර කාන්තා නිලධාරින්ට පෙර කී ලෙස පිලිකුල් සහගතව කතාකිරීම හෙලා දකින බව කියයි. ඉහත කී නිලධාරින් පස්දෙනා ජනක සේනාරතන් මහතා හමු වී රාජකාරී අවසානයේ ඔහුගේ කාර්යාලයෙන් පිටතට අපාසු පැමිනි අවස්ථාවලදී එම මහතා හැසිරුන ආකාරය සහ පිළිකුල් කතා විලාසය පිළිබඳව හඬමින් තමා සමග කියා ඇති බව ප්‍රකාශ කරයි. පරිපාලන අංශයේ ප්‍රධානී සුනීතා මහත්මිය සහ එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල්වරයාටද, සභාපතිවරයාටද කිප අවස්ථාවකදී තමා පැමිණිලිකර තිබුණ ද ඊට කිසිදු විසඳුමක් ලබා නොදුන් බව කියයි. එහෙයින් ආයතනයේ උසස් නිලධාරීන් අධ්‍යක්ෂ ජනක සේනාරත්න මහතාට සහය දක්වන බව කියයි. තමා රාජකාරී ලෙස විමර්ශන විශය භාරව කටයුතු කර අතර ජනක සේනාරත්න මහතා ඔහුගේ අදහස් උපදෙස් සටහන් කිරීමකින් තොරව වාර්තා සැකසීමට මැලිකමක් දක්වා තමාට නියෝගයක් ලෙස වාර්තා පිළියෙල කිරීමට දන්වන නමුත් එතුමාගේ අදහස් සහ වාර්තාවට ඇතුලත් කල යුතු කරුනු මොනවාද කියා තමාට දැනීමක් නොමැතිව රාජකාරී වශයෙන් එම අවස්ථාවලදී අසරණ තත්වයකට පත්වූ බව ප්‍රකාශ කරයි.

වාර්තා සැකසීම එතුමා විසින් නිසි ක්‍රමවේදයකට අනුව සිදුකල යුතු බව කියයි. වාර්තා සැකසීමට අපහසු අවස්ථාවලදී ඒ බව ඔහුට දැනුම් දුන්විට තමාට දෝෂාරෝපනය කරන බව එම අවස්ථාවලදී අපහසුතාවයට පත් වූ බව කියයි. තවද පසුගිය අවස්ථාවක පුහුණු නිලධාරිනියක් වශයෙන් කටයුතු කල ලක්ෂානි ප්‍රියංගිකා මෙනවිය රාජකාරී සඳහා ජනක සේනාරත්න මහතාගේ කාර්යාලයට ගිය අවස්ථාවකදී එතුමාගේ පැන උවමනාවෙන් එතුමාගේ දෙපා මුලට දමා ඔහුට නැමී එය අහුලා ගැනීමට නොහැකි නිසා ලක්ෂිකා මෙනවියට නැවී පැන අහුලා දෙන ලෙස කියා තිබෙනවා. ඇය විසින් අහුලා දී තිබෙන අතර එසේ පැන ලබානොදුන්නේ නම් ලිපිගොනු අත්සන් කිරීම උවමනාවෙන් ප්‍රමාද කරන බව ලක්ෂානි මෙනවිය ඇයට පැවසූ බව කියයි.

11. ජී.ඩී.අමල්කා උදයංගනී තිලකරත්න මහත්මිය - හිටපු කළමනාකරණ සහකාර

මෙම නිලධාරිනිය මේ වනවිට ප්‍රංශ රටේ රැකියාව කරයි. මෙම විමර්ශනයට අදාලව ප්‍රකාශයක් ලබාගැනීම සම්බන්ධයෙන් ඇයට දැන්වීම අනුව 2025.09.18 වන දින පෙරවරුවේ මාගේ වට්සැප් දුරකථනයට පිටු 03 න් යුත් ප්‍රකාශක් යොමු කර ඇති අතර එම ප්‍රකාශය මගින් ඉහත ඇය කළ පැමිණිල්ල අනුව ඇයට හිටපු අධ්‍යක්ෂ මානව සම්පත් ජනක සේනාරත්න මහතාගෙන් වාචික අපයෝජනය සිදුවූ බවත් ඒ අනුව ඇය අපහසුතාවයට පත් වී සේවයට පැමිණීමට පවා අප්‍රසන්නතාවයකට ලක්ව සිටි බවට සවිස්තර ප්‍රකාශයක් සිදුකර ඇත.

ජේ.ඒ.ඩබ්.ඩී. ජයසිංහ
සහකාර
කු විද්‍යා දෙපාර්තමේන්තුව කාර්යාංශය

12. උඩුවර ජනක පාලින්ද සේනාරත්න (අනිවාර්ය නිවාඩු යවා සිටින හිටපු මානව සම්පත් අධ්‍යක්ෂක)

දැනුම්දීමක් පරිදි අධ්‍යක්ෂක මානව සම්පත් උඩුවර ජනක පාලින්ද සේනාරත්න මහතා 2025/09/23 වන දින සහ 2025/09/30 වන දින මෙම කාර්යාලයට පැමිණ ප්‍රකාශයක්ලබා දී ඇත. ඒ අනුව මෙයට පෙර විමර්ශනයක් සිදු කළ එස්.කේ.එස්.ක්‍රිෂාන්ත සහ කේ.එච්.ඩී.ජයසිංහ 2024/05/22 වන දින ප්‍රකාශයක් ලබා ගත් බවත් එම ප්‍රකාශය මෙම අවස්තාවේ කියවා බැලීමෙන් පසු ප්‍රකාශය ලබා දෙන බව කියයි. ඉහත කී 2024/05/22 දාතම තමා ප්‍රකාශය ලබා දුන් විමර්ශන නිලධාරීන් තමාගෙන් කරුණු දෙකක් පිළිබඳ ප්‍රකාශ සටහන් කරගත් බවත් ඉන් එකක් මානව සම්පත් අංශයේ නිලධාරිණියන් පස් දෙනෙකු විසින් තමාට විරුද්ධව කර ඇති පැමිණිල්ල සහ තමා බඳවා ගන්නා අවස්තාවේ දී කාර්යාංශයේ බඳවා ගැනීම් පටිපාටිය අනුව ඔහුට තිබිය යුතු අවම සුදුසුකම් සහ අවම පළපුරුද්ද නිබී නොමැති බවය. නමුත්, පසු කාලීනව එම වාර්තාවේ පිටපතක් කාර්යාංශයෙන් ලබා ගත් පසු එම කරුණු දෙකට අමතරව තවත් කරුණු දෙක් පිළිබඳව නිරීක්ෂණ සහ නිගමන ඉදිරිපත් කර ඇති බව ය. එම විමර්ශනයන්ට පැවරූ කර්තවයන්ට (TOR) අමතරව ප්‍රකාශයක් ලබා නොගෙන ඉතිරි කරුණු දෙක එනම් සභාපතිවරයෙක් අවවාද කර ඇති බව සහ සභාපතිවරයෙකු විසින් නිදහසට කරුණු විමසීමක් සිදුකළ අවස්තාවේ ඊට ප්‍රතිචාර නොදැක් වූ බව ය. 2024/05/22 දාතම දී ඇති ප්‍රකාශය සඳහන් කර ඇති පරිදි 2023/12/28 දාතම ලිපිය මගින් නිලධාරිණියන් පස් දෙනෙකුගේ පැමිණිල්ල සහ මාගේ සුදුසුකම් පිළිබඳ කාරණය පිළිබඳව ඉදිරිපත් කොට ඇති බව ය. අනිවාර්ය නිවාඩු යැවීමේ ලිපිය පාදක වූවා යැයි එම ලිපිය සඳහන් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවේ එනම් 2021/12/21 වාර්තාවේ සඳහන් වන ආකාරයට කිසිදු කටයුත්තක් එවකට කළමණාකාරිත්වය විසින් සිදු නොකර නීති විරෝධි ලිපියක් මගින් තමා අනිවාර්ය නිවාඩු ගැන්වූ බව ද ඉන්පසු අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් නොතකා 2024/02/24 පැවති අංක 343 වැනි අධ්‍යක්ෂ මණ්ඩල කළමණාකාරිත්වය විසින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරමින් මාගේ සේවය අවසන් කරන ලෙසට අධ්‍යක්ෂ මණ්ඩලය ඉල්ලා තිබුණි. ඒ අනුව මා නිරීක්ෂණය කළේ 2023/12/21 වන දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ සහ නියෝග නොසලකා හරිමින් මාගේ සේවය අවසන් කිරීමට එවක කළමණාකාරිත්වය විසින් චේතනාන්විතව කටයුතු කර ඇති බව සඳහන් කරයි. මූලික විමර්ශනයක් සිදු කොට ඉන් අනාවරණය වන කරුණු සම්බන්ධව විනය පරීක්ෂණයක් පැවැත්වීමටත් මාගේ සුදුසුකම් සමාලෝචනය කර කාර්යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විමර්ශනයක් පැවැත් වීමය. මෙම නියෝගය සැලකිල්ලට නොගෙනන කළමණාකාරිත්වය විසින් මෙම කරුණු දෙක පිළිබඳ විමර්ශනයක් සිදු කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අංශයේ නිලධාරීන් දෙදෙනෙකු මගින් පරීක්ෂණ සිදු කර ඇත. මේ වනවිටත් කාර්යංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සුදුසකම් පිළබඳව සහ පළපුරුද්ද පිළිබඳ වාර්තාවක් ලබා දුන් බව කියි. මේ අනුව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් 2024/12/26 වන දිනැතිව අංක 349 දරණ කළමණාකරණ රැස්වීමට ඉදිරිපත් කර තිබුණි. මෙම විමර්ශන අවස්තා කිපයේ ම වෙනස් වාර්තා ඉදිරිපත් කර තිබූ අතර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ පරීක්ෂණ වාර්තාව අනුව තම සේවය අවසන් කිරීමට අනුමැතිය ඉල්ලා තිබූ අතර නැවතත් කොමිටුවක් පත් කොට තම අධ්‍යාපන සුදුසුකම් සම්බන්ධයෙන් පමණක් විමර්ෂණය කර වාර්තාවක් ලබා ඇති අතර අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බවට එම කොමිටුව පිළිගෙන ඇත. තමාට අවවාද කිරීමෙ ලිපිය සහ නිදහසට කරුණු දැක්වීමේ ලිපියට අනුව අවවාද ලිපිය ගේට්ටු අවසර පත්‍ර සම්බන්ධ කාරණයක් පමණක් බවත් නිදහසට කරුණු සම්බන්ධයෙන් ඔහු විසින් කරුණු සපයා ඇති බව කියයි. ඉහත කී කරුණු අනුව තම සෙද්වය අවසන් කිරීමට කටයුතු කිරීමට උත්සාහ දරන්නේ ද්වේශ සහගතව බව ප්‍රකාශ කරයි. මේ සම්බන්ධව අදාළ වන ඔහු සතු සියලු ලේඛන සහ තොරතුරු විමර්ශනයට ලබා දෙන බවත් කියයි. තමා හට කිසිදු චෝදනා පත්‍රයක් නිකුත් කර නොමැති බව කියයි. මීට පෙර විමර්ශන නුතක් පවත්වා ඇති අතර අද දින මෙම පවත් වන්නේ සිව්වැනි විමර්ශනය බව කියයි. රාජ්‍ය

ජේ.එම්.ඩබ්.එන්. ජයසිංහ
සභාපති
ගුණවිදියා සමීක්ෂණ හා පතල් ආ

පරාපාලන සහ / පරිසර අමාත්‍යාංශ විමර්ශන නිලධාරීන් කළ විමර්ශන වලට වොදනා පත්‍ර ඉදිරිපත් වී නොමැති බව කියයි. මාස 21වැනි දිගු කාලයක් ඉහත කරුණු සම්බන්ධයෙන් තීන්දුවක් නොගෙන ඇති බව ප්‍රකාශ කරයි.

නිරීක්ෂණය :

ජනක සේනාරත්න මහතා 2020 වසරේදී සිට අධ්‍යක්ෂ මානව සම්පත් තනතුරේ සේවය කළ අවස්ථාවෙන් පසුව ඇතිවූ සිදුවීම් පිළිබඳව මේ වනවිට විමර්ශන අවස්ථා 03 දී පවත්වා ඇති අතර ඉන් අනතුරුව මා විසින් සිදුකරන ලද වැඩිදුර විමර්ශනය සම්බන්ධයෙන් නිගමන සහ නිරීක්ෂණ/තීරණ පහත ඇතුලත් කරමි.

මීට ඉහත අවස්ථා 03 දී පවත්වා ඇති විමර්ශන සැකෙවින් මෙසේය.

01. HR/INQ/2023/22 අංකයෙන් යුත් විමර්ශනය පවත්වා ඇත්තේ පරිසර අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරී ඒ.එල් බස්නායක මහතා විසින් වන අතර 2023.12.22 වන දාතම එම වාර්තාව ඉදිරිපත් කොට ඇත.
02. රාජ්‍ය පරිපාලන ස්වදේශීය කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරීන් වන එස්.කේ.එස්.ක්‍රිශාන්ත මහතා සහ කේ.එච්.ඩී.ජයසිංහ යන මහතුන් විසින් සම්පාදිත මූලික විමර්ශන වාර්තාවක් 2024.09.10 දින ඉදිරිපත් කොට ඇත.
03. විශ්‍රාමික අධ්‍යක්ෂක විද්‍යාගාර සහ භෞතික පරීක්ෂණ හු විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ වයි.පී.එස්.සිරිවර්ධන මහතා විසින් සම්පාදිත මූලික විමර්ශන වාර්තාවක් 2025.08.26 වන දිනැතිව ඉදිරිපත් කොට ඇත.

මෙම වාර්තාවන් 03න් ENV/INV/02/03/GSMB/COM/530 යටතේ අධ්‍යක්ෂක විමර්ශන ඒ.එල්.බස්නායක මහතාගේ වාර්තාව ප්‍රකාරව නිලධාරිනියන් පස් දෙනෙකු ඉදිරිපත් කර ඇති ප්‍රකාශ අනුව එක් එක් ප්‍රකාශයන් හි සඳහන් කරුණු සමාන වන බව පෙන්නුම් කරන බැවින් පරිපාලන නිලධාරිනියගේ ප්‍රකාශය මගින් තහවුරු වන බැවින් යු.ජේ.පී.සේනාරත්න මහතා එම තනතුර දැරීමට සුදුසු ද යන්න කළමනාකරණ මණ්ඩලයේ තීරණයක් ගැනීමට ඉදිරිපත් කොට ඇත. මීට අමතරව මූලික සුදුසුකම් යටතේ 2020/07/26 පුවත්පත් දැන්වීම ප්‍රකාරව මූලික සුදුසුකම් යටතේ වසර 13ක සේවා පළපුරුද්ද සහ සුදුසුකම් යු.ජේ.පී.සේනාරත්න මහතා තෘප්ත කර නොමැති බව එම සම්මුඛ පරීක්ෂණයේදී සමත් අයදුම්කරුවෙක් ලෙස සැලකිය නොහැකිව තිබූ බව නිරීක්ෂණය කරමු යනුවෙන් ද නැවත පරීක්ෂණ මණ්ඩලයක් මගින් ඔහුගේ සුදුසුකම් සමාලෝචනය කර හු විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය විසින් ඔහුගේ පත්වීම සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බව සඳහන් කර ඇත.

ගොනු අංක HR/INQ/2023/22 යටතේ 2024.09.10 දිනැති රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශයේ විමර්ශන නිලධාරීන්ගේ වාර්තාවේ නිරීක්ෂන හා නිගමන අනුව,

01. මානව සම්පත් අංශයේ නිලදාරීන්ට අසභ්‍ය වචනයෙන් බැන වැදීම, කාන්තා නිලදාරිනියන්ට අශිලාචාර ලෙස ආමන්ත්‍රණය කිරීම හෝ අසභ්‍ය වචන භාවිතා කරමින් ආමන්ත්‍රණය කිරීම සහ වාචික අපයෝජනයට ලක් කිරීම යන චෝදනා අනුව පැමිණිලි කර තිබීම පදනම් කරගෙන නැවත

ඒ.එල්.එස්.එන්. ජයසිංහ
අධිපති
හු විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ

වරක් අංශයේ ප්‍රධානියා ලෙස පත්වුවහොත් ඔහුගේ බලය යොදවා නිලධාරිනියන් පීඩාවට පත් කිරීමේ සම්භවයක් ඇති බව.

02. නිලධාරියා අදාල තනතුරට බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති බව.

03. ආයතනයෙන් යූ.ජේ.පී.සේනාරත්න මහතාට අවවාද කිරීමක් සහ නිදහසට කරුණු විමසීමක් සිදුකර තිබූ අවස්ථාවේ පිළිතුරු ලබාදී නොමැති බැවින් එම නිසා එම වැරදිවලට වරදකරු ලෙසට සැලකිය යුතු බව.

- විමර්ශන වලට භාජනය වී ඇති චෝදනාමය යම් යම් කරුනු යටතේ ඉහත විමර්ශන වාර්තා 03 ප්‍රකාරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙ බඳවා ගැනීම් පටිපාටිය අනුව බාහිර අයදුම්කරුවෙක් වශයෙන් අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බවත් අවම වසර 13 ක සේවා පළපුරුද්දක් හා අතිරේකව වසර 04 ක් සහ මාස 07 ක සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර ඇති බව සනාත කරයි.
- මෙයට අමතරව අධ්‍යක්ෂ මානව සම්පත් ජනක සේනාරත්න මහතා සිදුකල වැරදි සම්බන්ධයෙන් නිදහසට කරුනු විමසීමේදී ඔහු පිළිතුරු ලබාදී නොමැති අතර වාහන අවභාවිතා කිරීමේ යම් වරදකට මුදල් ගෙවීමක් සිදුකර ඇති බවට වාර්තා වේ.

<u>නිර්දේශ</u>

යූ.ජේ.පී.සේනාරත්න මහතා බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සුදුසුකම් සපුරා නොමැති බවද කාර්යාංශයේ නිලධාරිනියන් ලබා දී ඇති ප්‍රකාශ වල සඳහන් කරුණු සාමන බවත් ඔහු තවදුරටත් අදාල තනතුරේ සේවය සඳහා යෙදවීම සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බවට නිර්දේශ කර ඇත.

යූ.ජේ.පී.සේනාරත්න මහතාගේ කටයුතු සම්බන්ධව නිදහසට කරුණු විමසීම සඳහා ඔහු විසින් පිළිතුරු ලබාදී නොමැති වුවත් ඔහුගේ තනතුර තවදුරටත් වලංගු නොවන බැවින් විනයානුකූලව කටයුතු කිරීමේ අවශ්‍යතාවක් මතුනොවන බව නිර්දේශ කරමු යනුවෙන් සඳහන් කර ඇත.

04. ගොනු අංක HR/INA/08 සමාංකයෙන් යුත් 2025.08.26 දිනැති සභාපති ජේ.පී.එස්.සිරිවර්ධන මහතා ප්‍රමුඛ ත්‍රිපුත්ගල විමර්ශන නිලධාරී මඩුල්ල ඉදිරිපත් කල මූලික විමර්ශ වාර්තාව අනුව පූර්ණ පරීක්ෂණයක් පවත්වා යූ.ජේ.පී.සේනාරත්න මහතා බඳවා ගැනීමේ පටිපාටිය අනුව බාහිර අයදුම්කරුවෙක් වශයෙන් අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති බව.

වසර 13 ක සේවා පළපුරුද්දක් සහ අතිරේක වසර 04 ක් සහ මාස 07 ක සේවා පළපුරුද්දක් සම්පූර්ණ කර ඇති බව නිගමනය කර ඇත.

මෙයට අමතරව ඉදිරියේදී කාර්යාංශයේ සිදුකරන මෙවැනි බඳවා ගැනීම් ආරම්භයේ සිට අවසානය තෙක් නිශ්චිත නිලධාරීන් වෙත ඒවායේ වගකීම් පවරා විධිමත්ව එම කටයුතු සිදුකිරීම සහ අදාල ලේඛණ විෂය ගොනු විධිමත්ව පවත්වාගෙන යෑමට කටයුතු කිරීමට නිර්දේශ කර ඇත.

ජේ.ඩබ්.එස්.වත්. ජයසිංහ
සභාපති
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ

05. ඉහත විමර්ශන 03 හි සියලු ලේඛන සහ වාර්තා සහ ප්‍රකාශ මා විසින් පරිශීලනය කරන ලදී. ඒ අනුව පහත සඳහන් කරුනු එකිනෙකට නිරීක්ෂණයන් වශයෙන් ඉදිරිපත් කරමි.

01. චෝදනාවට ලක්ව ඇති ජනක සේනාරත්න මහතා මෙම ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ සාමාජිකයෙකි. ආයතනයේ අධ්‍යක්ෂකවරුන් යම් ආයතනයක ආයතනීය අරමුණු හා ඉලක්ක වෙත ආයතනය මෙහෙය වීමේ වගකීම දරණ ඉහලම කාණ්ඩය වේ. ඒ අනුව අධ්‍යක්ෂකවරයෙකුගේ හැසිරීම, ක්‍රියාකලාපය, රාජකාරිත්වය දැරීම, ආයතනයේ ඉහළ කලමණාකාරිත්වය ඇතුළු පහළ ශ්‍රේණියේ සේවකයා දක්වා පූර්වාදර්ශී තනතුරකි.
මෙම කාන්තා නිලධාරිනියන්ට ජනක සේනාරත්න මහතාගෙන් සිදුවූ වාචික අපයෝජනය සහ පරුෂ වචනවලින් කෑ කෝ ගසමින් ඔවුන් පීඩාවට පත්කිරීම මෙම සිදුවීම විග්‍රහ කිරීමේදී පෙනී යන්නේ යම් රජයේ ආයතනයක තම දියනියක් සේවය සඳහා එවන මව්පියන් රජයේ ආයතනයක් නිසා 'ආණ්ඩුවේ රස්සාවක්නේ.විශ්වාසයක් තියෙනවා.පරිස්සමටහොඳයි' යන චේතනාව මුල් කරගෙන තම දැරියන් රාජ්‍ය සේවයට එක්කරන්නේ යම් විශ්වාසනීයත්වයක් ඇතුවය. වැඩිහිටි නිවාසයක්, කාන්තා නිවාසයක්, ළමා නිවාසයක් හෝ වෙනයම් සියළුම රැකියා ආයතනවල ප්‍රධානීන්ට සියළුම සේවකයන් වෙනුවෙන් වගකීමකට බැඳී සිටිනු ඇත. මෙම අධ්‍යක්ෂවරයා වෙත පවරා තිබුනේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට අනුබද්ධිත සියළුම සේවකයන් මානව සම්පත් අඩුපාඩුවක් නොමැතිව කිසිවෙකු අගතියට පත් නොවන ලෙස සුරැකීමයි.
නමුත් මෙම නිලධාරියාගෙන් සිදුවී ඇත්තේ හාත්පසින්ම එම නියාමනයන්ට විරුද්ධ අනිසි සැලකීමකි. මේ අනුව සියළුම රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනවල මානව සම්පත් සුරැකීමේ බලය පවරා ඇති විධායක හෝ සෙසු නිලයන්වල නිලධාරීන්ට පූර්වාදර්ශක් මෙම සිද්ධිය තුළින් පෙන්වා දීම යුතුකමකි.
මෙම පූර්වාදර්ශනය ප්‍රශස්ත ආකාරයෙන් දැරීම අධ්‍යක්ෂකවරයෙකු සතු අනුරංගනීය වගකීමකි.අධ්‍යක්ෂකවරයෙකු සතු වගකීම මේ ආකාරයෙන් පැවතියදී එකී අධ්‍යක්ෂකරවයා මානව සම්පත් කටයුතු භාර අධ්‍යක්ෂකවරයෙකු වී එකී වගකීම තවදුරටත් වැඩි කරන්නෙකි. එනම් ජනක සේනාරත්න මහතා අධ්‍යක්ෂකවරයා මානව සම්පත් අංශය භාරව පත්වීම තුළ ඔහු ආයතනයේ විනය හා යහපැවැත්ම සහතික කිරීමෙහිලා ප්‍රමුඛතම පුද්ගලයා වේ. ඔහු තම තනතුර අනුව තමාට නියමිත විශය කටයුතු සම්බන්ධව සභාපතිවරයාට මෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරුන්ට වගකිව යුතු අතර ඒ හරහා රේඛීය අවකාශයේ වගකීමට බැඳේ.

02. මානව සම්පත් අධ්‍යක්ෂවරයා තම තනතුර දරමින් සිටිය දී සිදුකල බවට ලිඛිත චෝදනා ලැබූ වරද ශ්‍රී ලංකා නීතියෙහි ලා බරපතල අපරාදමය වගකීමක් දරණ වගකීමක් ඇති වරදක් වන අතර 1995 අංක 22 දරණ පනතින් සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහයේ වගන්ති 345 අනුව 'අඩන්තේට්ටම් කිරීමෙන් හෝ සාපරාදී බලහත්කාරය පෑමෙන් යම් තැනැත්තෙකුට ලිංගික අතවර කරන හෝ වචනයෙන් හෝ ක්‍රියාවෙන් යම් තැනැත්තෙකුට ලිංගික හිරිහැරයක් හෝ අතවරයක් සිදුකරන කවර හෝ තැනැත්තෙකු ලිංගික අතවර කිරීමේ වරද සිදුකරන බව' සඳහන් කොට දක්වා ඇත.

ජේ.ඩබ්.වඩු... ප්‍රසාදිනී
භූ විද්‍යා සංවර්ධන සහ පතල් කාර්යාංශය

මෙයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 31:1:10 රාජ්‍ය සේවය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම යන වගන්ති ප්‍රකාරයෙන් අපරාධමය වරදක් සම්බන්ධව චෝදනා ලැබ ඇත.

03. මෙවැනි අධ්‍යක්ෂක තනතුරක් දරණ පුද්ගලයෙකු අපරාද වගකීමට අදාල චෝදනා සම්බන්ධයෙන් චෝදනාවකට ලක්ව ඇති අවස්ථාවක හා ඒ සම්බන්ධයෙන් බැලූ බැල්මට සනාථ වන/තහවුරු කල හැකි/ විභාග කළ යුතු මට්ටමේ ලිඛිත හා වාචික සාක්ෂි ඉදිරිපත් වී ඇති අවස්ථාවක ඒ සම්බන්ධයෙන්

I. චෝදනා ලැබූ අය වහාම චෝදනා විභාග කිරීමට නිසි ස්වාධීන හා අපක්ෂපාති පරිසරයක් ඇතිකරනු වස් තනතුරෙන් ඉල්ලා අස්විය යුතුය හා , හෝ නැතහොත් අදාල විමර්ශනයට අවහියක් නොවන පරිදි අදාල අධ්‍යක්ෂක වරයාට සිය තනතුරෙන් ඉල්ලා අස්වන ලෙසට අධ්‍යක්ෂක මණ්ඩලය දැනුම් දිය යුතුය.

04. අධ්‍යක්ෂකවරයාට ඉදිරිපත් වී ඇති චෝදනා බරපතල චෝදනාවක් වන බැවින් ඔහුට එරෙහිව චෝදිත පාර්ශවය විසින් පොලිසිය/ ළමා කාන්තා කාර්යාංශය වෙත නිසි පැමිණිල්ලක් සිදුකල යුතු අතර අදාල සිදුවීම් දාමය අයාතන පරිශ්‍රය තුළ සිදුවූ බවට කරුනු සහ සාක්ෂි 10 ක් (මා විසින් ඉහත සටහන් කරගත් ස්වාධීන සාක්ෂි කරුවන් 10 දෙනා ඉදිරිපත් කර ඇති කරුණු අනුව) ඉදිරිපත් වී ඇති බැවින් මෙම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ගොඩනැගිල්ල තුළ නිල රාජකාරී මට්ටමින් පැමිණිලි සඳහා නිලධාරීන්ට පහසුකම් සැලසිය යුතු අතර පැමිණිලිකරුවන්ගේ රැකියා සුරක්ෂිතභාවය සඳහා ඔවුන් වෙනුවෙන් පෙනී සිටිය යුතුය.

05. ඉහත සිද්ධියට අදාලව මේ වනවිට ගංගොඩවිල මහේස්ත්‍රාත් අධිකරණයේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මකව පවතින බැවින් ආයතනයේ අයිනිවාසිකම් වෙනුවෙන් අදාල නඩුවේදී ආයතනය නියෝජනය වන නීතිඥ සහය ලබාදිය යුතුය.

06. ඉදිරිපත්ව ඇති කරුනු අනුව වැටුප් සහිතව චෝදනාවට ලක්වූ අය අන්‍යාකාරයෙන් තවදුරටත් අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් මෙම නෛතික හා විමර්ශනයට මැදිහත්ව සිටීමේදී බලපෑම් කිරීමේ හැකියාවක් නිරත විය හැකිය. මෙය කිසිසේත් අනුමත කල නොහැකි තත්වය අපරාද චෝදනා ගනයෙහි ලා වැටෙන චෝදනාවක් බැවින් චෝදනා ලැබූ අය ඉහත තනතුර ලැබූ අයකු බැවින් රටේ ක්‍රියාත්ම නෛතික විධි විධාන සහ ආයතනයේ අභ්‍යන්තරයේ විනය සහ නිසි පැවැත්ම පවත්වාගෙන යනු වස් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකට යටත්ව වහාම ක්‍රියාත්මක වන පරිදි මොහුගේ සේවය අවසන් කළ යුතුය.

07. කෙසේ වෙතත් අපරාද වරදක් සිදුකල බවට චෝදනාවකට ලක්වූ අවස්ථාවේ වැටුප් ගෙවීමකට යටත්ව අනිවාර්ය නිවාඩු ගැන්වීමට සාදාරණ විනය තීරණයක් නොගෙන පක්ෂග්‍රාහීව නීතියට පටහැනි චෝදනාවට ලක්වූ අයට පක්ෂපාතීත්වයෙන් ගත් අනීතික තීරණයක් බව සඳහන් කරමි.

ජේ.එම්.එස්.එන්. ජයසිංහ
සභාපති
භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

08. මීළඟට සලකා බැලිය යුතු වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙම තීරණය ගත්තේ නම් අධ්‍යක්ෂක මණ්ඩලයට මෙම තීරණය ගැනීමට යෝජනා කළේ කවර තනතුරක් දැරූ අයෙක්ද යන්නය. එම අවස්ථාවේදී අධ්‍යක්ෂක මණ්ඩලයට මේ සම්බන්දයෙන් තීරණයක් ගැනීමට හැකිවන පරිදි සියළු තොරතුරු,ලේඛන /වාර්තා/ප්‍රකාශන ඉදිරිපත් කර තිබුනේද යන්න විමර්ශනය කළ යුතුය. චෝදනාවට ලක්වූ අය මානව සම්පත් අධ්‍යක්ෂක වූ හෙයින් ඔහුගේ තනතුරට යටත් සේවකයන්, නිලධාරියෙක් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර තිබුණේ නම් ඔහු ඉහත චෝදනාවට ලක්වූ අධ්‍යක්ෂක මානව සම්පත් යන අයගේ බලපෑම් සහ අවනිදේශනය වන ඉහත පත්‍රිකාව සහ චෝදනාව අධ්‍යක්ෂකවරයාට වාසිදායී අයුරින් ඉදිරිපත් කර ඇති ද යන්න සැකයට භාජනය නොවන තර්කයකි. ඒ අනුව අදාල අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කළ සේවකයාගේ ප්‍රකාශය ඉතාම වැදගත් වන අතර ඔහු විසින් සකස් කල අධීක්ෂණ මණ්ඩල පත්‍රිකාවද එම අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාව පරීක්ෂා කළ අය නිර්දේශ කළ අයද සිදුවීම පිළිබඳව විශය සම්බන්ධයෙන් මනා හා නියම අවබෝධයකින් සිටියේද යන්න පරීක්ෂා කලයුතුය. සරලව ප්‍රකාශ කලහොත් අපරාද වගකීමක් උද්ගතවන මෙම බරපතල සිදුවීම එම බරපතලභාවයට සාදාරණයත්වයක් ලබාදෙමින් ඉදිරිපත් කර තිබුණාද නොමැතිනම් හුදු සරල සිදුවීමක් ලෙස ඉදිරිපත් කලාද යන්න පරීකෂා කළ යුතුය.

09. මානව සම්පත් අධ්‍යක්ෂක ජනක සේනාරත්න මහතාට එරෙහිව ඉදිරිපත් වූ බරපතල චෝදනා මත වැටුප් ගෙවීමකින් තොරව සේවය අවසන් කළ යුතු වුවත් නීති විරෝධීව හා අනීතික ලෙස චෝදනාවට ලක්වූ අයට සාදාරණයක් හා පක්ෂ පාතීත්වයක් පළ කරමින් 28.12.2023 දිනැති දාතම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශ අංක CH/PAN/2023/53 යටතේ එවකට සභාපති ආචාර්ය සංජය පෙරේරා මහතා විසින් නිල මුද්‍රා තබා අත්සන් කොට ඇති සහ ඉංජිනේරු එච්.ජේ.එම්.ගුණසේකර අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ) වශයෙන් යූ.ජේ.පී.සේනාරත්න මහතා වෙත අනිවාර්‍ය නිවාඩු නිර්දෙශ කොට ලිපිය යොමුකල එකී දින සිට වැටුප් ගෙවීමට කටයුතු කර ඇති හෙයින් එම දින සිට ගෙවන ලද වැටුප නීත්‍යානුකූල පදනමක් මත ගෙවන ලද වැටුපක් නොවන හෙයින් අදාල වැටුප ලැබූ අය මෙන්ම ගෙවීමට නිර්දේශ කළ අයද ඉහත මුදල් භාවිතය රාජ්‍ය මුදල් අවභාවිතාවක් හෙයින් පොදු දේපළ පනත ප්‍රකාරව ඔවුන්ට එරෙහිව නීති මගින් ක්‍රියා කළ යුතුය. ඒ සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි මුදලේ වටිනාකම ගණනය කොට පොලිසිය වෙත හෝ නිසි විමර්ශන අයතනයක් වෙත පැමිණිල්ලක් සිදුකල යුතුය.

නිගමනය :

01. චෝදනාවට ලක්වූ අධ්‍යක්ෂක මානව සම්පත් ජනක සේනාරත්න මහතා සම්බන්ධයෙන් ගෙන ඇති විනය ක්‍රියාමාර්ග අනීතිකව මෙන්ම නීතියට පටහැනිය. එය රටේ පොදු නීතියට මෙන්ම සුවිශේෂිත නීති මගින් තහවුරු කර ඇති ළමා හා කාන්තා අයිතිවාසිකම් අනුව 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහ සංශෝධිත පනත අනුව තහවුරු කර ප්‍රතිෂ්ඨාපනය කර බලාපොරොත්තු වන මූලිකාංගයන්ට පටහැනි බැවින් මුලුමනින්ම පක්ෂග්‍රාහී සැලකීමකි. තනතුරට යටත්ව පීඩාවකට පත්ව බලපෑමකට ලක්ව ගන්නා ලද තීරණයකි.

02. අධ්‍යක්ෂක මානව සම්පත් ජනක සේනාරත්න මහතාට විරුද්ධව ඉදිරිපත් වූ අපරාද චෝදනා සම්බන්ධයෙන් මූලික විමර්ශන 03 ක් පැවැත්වීමෙන් ද විනය බලධාරීන් චෝදනාවට ලක් වූ අය වෙනුවෙන් පෙනී සිටින බව මොනවට පැහැදිලි වනු ඇත.

03. මූලික විමර්ශන 03 ක් පැවැත්වීමේදී පසුගිය දීර්ඝ කාලයක් තුළ වැටුප් ගෙවීමට මේ දක්වා විනය තීරණයක් නොගැනීමට සලකා බැලීමේදී මෙම සිදුවීමට අදාල චෝදනා ලැබූ අයව රැකීමට යම් බලයලත් කණ්ඩායමක් සැලසුම් සහගතව කටයුතු කළ බව නිගමනය කරමි.

04. ඒ අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි පරිවාස කාල සීමාවේ පසුවන අවධියේ මෙම සියළු වැරදි සිදු කළ මෙම නිලධාරියාගේ සේවය අවසන් විනය බලධාරියා විසින් තීරණයක් ගත යුතුය.

05. ඒ අනුව ආයතනයේ විනය පවත්වාගෙන යාම ද සෙසු සේවකයන් වෙත වැරදි පූර්වාදර්ශනයක් වැලැක්වීමටද රාජ්‍ය නිසි යහපාලන ප්‍රතිපත්තියට අනුකූල වීමටද සනාත කරුණු වස් ඉදිරියේදී නිසි පරීක්ෂණයක් පවත්වා කරුනු තහවුරු කරගන්නා තෙක් ඉහත කී ආකාරයට වහාම ක්‍රියාත්මක වන පරිදි වැටුප් ගෙවීමකින් තොරව ජනක සේනාරත්න මහතාගේ සේවය අවසන් කිරීමට නිර්දේශ කරමි.

විමර්ශන නිලධාරී
යූ.ඊ.සී.රොද්‍රිගෝ

ජේ.එම්.එස් විත්. ජයසිංහ
නෑ විද්‍යා සම්පාදක හා සොල්ලි කාර්යාංශය